# සයුරු සැරිය

විනුදිනි තිමෙත්මා



# සයුරු සැරිය

වඩුගේ සෙතුම් විනුදිනි තිමෙත්මා

සයුරු සැරිය

© වඩුගේ සෙතුම් විනුදිනි තිමෙත්මා

පළමු වන සංස්කරණය 2025 පෙබරවාරි

ISBN 978-624-208-337-7

# පිදුම

මගේ ආදරණීය චූටි නංගී

මිනුද්‍රිනි ඉමෙත්මාට

අක්කාගෙන්

ලෙන්ගතුව සෙනෙහසින්!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන 'හෙරණගත්කරණී' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# සයුරු සැරිය

මගේ නම තිමෙත්මා. මගේ නංගී ඉමෙත්මා. අපි දෙන්නා වතුරට හරිම බයයි. ඒ වුනාට අප්පච්චියි අම්මයි නම් වතුරට හරිම කැමතියි. ඉතිං අපි ගමනක් යන කොට  වතුර තියෙන තැනකට එක්ක ගෙන යනවා මයි.


එදා 2004 දෙසැම්බර් 26. අපි ගියා ගාලු කොටුව ළඟ මුහුදට. නැවතිලා හිටපු හෝටලයෙන් උදේ ම මුහුදට පිටත් වුන අපි ටිකක් පරක්කු වෙන කම් මුහුදු වෙරළේ හිටියා. අම්මයි අප්පච්චියි හොඳට මුහුදේ නෑවා. ඒත් නංගීයි මමයි මුහුදේ නාන්න ගියේ නෑ.


ඔහොම ඉන්න කොට මහ පුදුම දෙයක් වෙන්න පටන් ගත්තා. මුහුද ගොඩක් ඈතට යන්න පටන් ගත්තා. ගොඩක් මිනිස්සු මුහුද ළඟට ම ගියා. මොකක්ද වෙන්නේ බලන්න. ඒ වුනාට මමයි නංගීයි ළඟට ගියේ නෑ. ඈතට දිවුවෙත් නෑ. අපි හිටපු තැනම හිටියා. වැඩි වෙලාවක් යන්න කලින් අපි දැක්කා ඈත මුහුදේ ලොකු රැල්ලක් එනවා. ඒක අඩි විස්සක් විතර උස රැල්ලක්. අපි දෙන්නා පුළුවන් තරම් වේගයෙන් දිවුවත් අපට බේරෙන්න බැරි වුනා.

ඒ රැල්ල ඇවිත් අපිව මුහුදට ඇදගෙන ගියා. අම්මයි අප්පච්චියි දෙන්නත් ඒ රැල්ලට අහු වුනා. ඒත් එක්කම ඒ දෙන්නා අපෙන් ඈත් වුනා. අපි දෙන්නා තනි වුනා. එතනින් එහාට මොනවද වුනේ කියලා මම දන්නේ නෑ. අපට සිදු වුන දේ නිසා මට සිහිය නැති වෙන්න ඇති.

මට ඇහැරෙන කොට මට අමුත්තක් දැනුණා. මම හිටියේ මුහුදු පතුලේ කියලා මට තේරුම් ගියා. මට හුස්ම ගන්න පුළුවන් වෙලා තිබුණා. මගේ යටි කයේ කකුල් තිබුණේ නැහැ. ඒ වෙනුවට මට මාළුවෙකුගේ යටි කය ඇවිත් තිබුණා. මම නංගී දිහා බැලුවා. එයාටත් මට වාගේ ම මාළුවෙකුගේ යටි කයක් ඇවිත් තිබුණා.

මම වට පිට බැලුවා. මම හිටියේ ඇඳක් උඩ. මගේ ඉස්සරහින් අමුතු හැඩයක් තියෙන කෙනෙක් හිටියා. එයාටත් මට වාගේ ම මාළුවෙකුගේ යටි කයක් තිබුණා. “ඔයා කවුද?, මම මෙතැනට ආවේ කොහොමද?” මම ඇයගෙන් ඇහුවා.





“මම දිය කිඳුරියක්. මම කෑම හොයා ගෙන යන කොට මම දැක්කා ඔය දෙන්නා සිහිය නැති වෙලා ඉන්නවා. ඉතිං මම ඔයාලා මගේ ගෙදර අරගෙන ආවා. මම ඔයාලාට හුස්ම ගන්න පුළුවන් වෙන්න, ඔයාලා ව දිය කිඳුරියෝ කළා.” දිය කිඳුරිය කියුවා..

“එතකොට අපට ආයේ මිනිස්සු වෙන්න බැරි ද?” නංගී බියවී දිය කිඳුරියගෙන් ඇහුවා.

“ඔයා බය වෙන්නේ නැතිව ඉන්නකෝ. අපි බලමු.” දිය කිඳුරිය කරුණාවන්තව කීවා.

“මේ... මේ... ඔයාගේ නම මොකක්ද?” මම එයාගෙන් ඇහුවේ හරිම කුතුහලයකින්.

“මගේ නම මීරා. ඔයාලාගේ නම් මොනවද?” දිය කිඳුරිය පිළිතුරු දුන්නා.

“මම තිමෙත්මා. මේ මගේ නංගී. එයාගේ නම ඉමෙත්මා.” මම කියුවා..


“මේ... මීරා අක්කේ... අපි අද මුහුදේ ඉන්න කොට මුහුද ඈතට ගියා. ඊට පස්සේ අඩි විස්සක් විතර උස රැල්ලක් ඇවිත් අපිව මුහුදට ගසාගෙන ආවා. ඒ මොකක්ද?” නංගී පුදුමයෙන් ඇහුවා.

“ආ... ඒකට අපි කියන්නේ සුනාමි කියලා. අපේ මහ පොළොව හැදිලා තියෙන්නේ භූ තැටි කියලා කැබලි කීපයක් එකතු වෙලා. සුනාමි තත්වයක් ඇති වෙන්නේ මුහුද ඇතුළේ තියෙන භූ තැටි දෙකක් චලනය වෙන කොට. අර ඔයාලා කිවුවේ මුහුද ඈතට ගියා කියලා. එහෙම වෙන්නේ භූ තැටි දෙක ඈත් වෙන කොට ඒ අඩුව පුරවන්න වතුර යන නිසා. ඊට පස්සේ ඒ භූ තැටි දෙක ආයෙමත් ළං වෙන කොට අර අඩුව පුරවන්න ගිය වතුර ටික රැල්ලක් බවට පත් වෙනවා. මුහුද මැදදී පොඩි රැල්ලක් විදිහට පටන් ගන්න සුනාමි රැල්ල ගොඩ බිමට එන කොට ලොකු රැල්ලක් බවට පත් වෙනවා. භූමි කම්පා වෙන්නෙත් මහ පොළොව ඇතුළෙ තියෙන භූ තැටි දෙකක් චලනය වුණාම. ඉතිං ඔය නංගීලා දැන ගන්න ඕන මුහුද ඈතට යනකොටම උස තැනකට යන්න.” මීරා අක්කා පැහැදිලි කලා.

“බොහොම ස්තූතියි අක්කේ කියලා දුන්නාට. දැන් අපිට අම්මටයි අප්පච්චිටයි කියන්න පුළුවන්.” නංගී කියුවා.

“ආ... ඔයාලට අම්මා කෙනෙකුයි අප්පච්චි කෙනෙකුයි ඉන්නවද? එයාලට සුනාමියෙ දී මොකද වුනේ?” මීරා අක්කා ඇහුවා.

“අපි එකට තමයි හිටියේ. ඒත් රැල්ල එනකොටම අපි වෙන් වුණා.” මම කඳුළු සලමින් මීරා අක්කාට කියුවා.





“අඬන්න එපා නංගී එයාලට මොකුත් වෙලා නැතුව ඇති.” මීරා අක්කා කියුවා.

“අක්කේ මට හරි බඩගිනියි. කන්න මොකුත් නැද්ද?” නංගී ඇහුවා.

“අපි කන්නේ මුහුදු පැළෑටි. ඔයාලා ඒවාට කැමති වෙයිද කියල නම් දන්නේ නෑ. හැබැයි ඒ වගේ හොඳ රසක් නම් තියෙනවා.” මීරා අක්කා කියුවා.

“කමක් නෑ අක්කේ මොනවා හරි කන්න තිබ්බා නම් ඇති.” මම කියුවා.

මීරා අක්කා අපට මුහුදු පැළෑටි කන්න ගෙනත් දුන්නා. අපි ඒවා කාලා ඉවර වෙලා මම මීරා අක්කාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. “අර අපි සුරතලයට, ටැංකි වල ඇති කරන මාළුවන්ට දාන කෑම ජාතියට දාලා තියෙන දේවල් මොනවද?”

“අනේ නංගී... මම නම් ඕකට උත්තර දෙන්න දන්නෙ නෑ... මම මාළුවෙක් නෙමෙයිනේ... අපි අද යමු මගේ යාළුවාගේ ගෙදර. එයා මාළුවෙක්. එයාගේ නම ඩොල්ෆි.”

“එයා ඕකට උත්තරේ දන්නවා ඇති එයාගෙන් අහන්න.” මීරා අක්කා කියුවා.

නංගී මීරා අක්කාගෙන් මෙහෙම ඇහුවා. “අපි දැන් පිටත් වෙන්නේ නැද්ද?”


“දැන් අපි පිටත් වෙන්න ඕන නංගී. යමු යමු ඉක්මනට යමු.” මීරා අක්කා කියුවා.


අපි ඩොලරි ගේ ගෙදර යන්න පිටත් වුනා. මෙහෙම යද්දී නංගීට ප්‍රශ්නයක් ආවා. “ඇයි අපි මුහුදේ ගැඹුරට ම පීනලා යන්නේ නැත්තේ?”

“නංගී අපට ගැඹුරට ම යන්න බෑ. ඇයි දන්නවා ද?, මුහුදේ පතුලට යන්න යන්න පීඩනය වැඩි වෙනවා. අපි එහෙම ගියොත් අපි තෙරපිලා අපට ඉක්මන් මරණයක් ගෙන දෙන්නත් පුළුවන්” මීරා අක්කා කියුවා.

“එතකොට අක්කේ එහෙම පීඩනය වැඩි වෙන්නේ කොහොමද?” මම ඇහුවා.

“එහෙම වෙන්නේ නංගී මුහුදේ උඩ ඉඳන් තියෙන වතුර වල බර, යට තියෙන වතුර දරා ගන්න ඕන නිසානේ... එතකොට තමයි පීඩනය වැඩි වෙන්නේ.” මීරා අක්කා කියුවා.





“මම අහල තියෙනවා මරියානා අගාධය පතුලේත් ජීවීන් ඉන්නවා කියලා. එයාලත් තෙරපිලා මරණයට පත් වෙන්න ඕන නේද” නංගී මීරා අක්කාගෙන් ඇහුවා.

එතකොට මීරා අක්කා මෙහෙම උත්තර දුන්නා. “ඔයා කියපු දේ හරි. ඒ උනාට එයාලා මැරෙන්නේ නෑ. එයාලාගේ ඇඟ හැදිලා තියෙන්නේ ඒ පීඩනයට ඔරොත්තු දෙන විදිහට. අපට ගැඹුරේ දී මොනවත් පෙනෙන්නේ නැති උනාට එයාලාට පේනවා. එහෙම පෙනෙන්නේ එයාලාගේ ඇඟෙන් ආලෝකයක් නිකුත් කරන නිසා. අනික ඒ අතරින් බොහෝ දෙනෙක් ඉතා දරුණුයි. අපි එතැනට ගියොත් එයාලාට අප ව ආහාරයට ගන්නත් පුළුවන්.”

“අක්කේ… ඩොල්ෆිගේ ගෙදරට තව කොච්චර දුරද?” මම අක්කාගෙන් ඇහුවා.

“තව කිලෝමීටරයක් විතර දුර ඇති. මම නම් හිතුවේ රෑට නවතින්න ම යන්න. ඔයාලා ඒකට කැමති ද?” මීරා අක්කා ඇහුවා.

“මම නම් හරිම කැමතියි.” නංගී කියුවා.

“මටත් ඒකම තමයි කියන්න තියෙන්නේ.” මම කියුවා.


අපි මීටර් පන්සීයක් විතර දුර ගියා. නංගී එක පාරටම වෙන පැත්තකට යන්න පටන් ගත්තා. මීරා අක්කයි මමයි බය වුනා. අපි දෙන්නම නංගී පස්සෙන් ගියා. එයා දිගටම ගිහින් ලොකු කොරල් පරයක් ගාව නතර වුණා.

“බලන්නකෝ මේකේ ලස්සන… ලොකු කොරල් පරයක්… මම මේක අල්ලනවා…” එහෙම කියලා නංගී ඒක අල්ලන්න හදන විටම මීරා අක්කා එතනට ගියා.

“හෝව්… හෝව්… හෝව්… ඕක අල්ලන්න එපා. අපි මුහුදේ තියෙන ජාතිවලට හානි කරන්න හොඳ නෑ.” මීරා අක්කා කියුවා.

“අක්කේ… මම අහලා තියෙනවා මේ කොරල් පර වලට පණ තියෙනවා කියලා…” මම කියුවා.

මීරා අක්කා මෙහෙම උත්තර දුන්නා. “ඔව් නංගී, ඔයා කියපු දේ හරි. කොරල්පර වලට පණ තියෙනවා… ඔය දෙන්නට පේනවා ඇති යට තියෙන කොරල්පර සුදු පාටට. ඒ තමයි කොරල්පර වල ඇටසැකිලි. නැත්නම් මැරුණු කොරල්. කොරල්පර





ඇතුලේ ගොඩක් මුහුදු ජීවීනුත් ඉන්නවා. ඒ කියන්නේ පොඩි පොඩි මාළු ජාති එහෙම. දැන් දැන් මිනිසාගේ ක්‍රියාකාරකම් නිසා කොරල්පර වඳ වීමේ තර්ජනයට ලක් වී තියෙනවා.”

“ඉතින් අක්කේ අපි ඒකට මොකද කරන්න ඕන.” නංගී මීරා අක්කාගෙන් ඇහුවා.

“අපි මේ වටිනා සාගරයට කුණු දාන්න හොඳ නෑ ඒ වගේම ඔයා ඒ කරන්න ගියා වගේ මුහුදේ සම්පත් විනාශ කරන්න හොඳ නෑ.” මීරා අක්කා නංගීට කරුණාවෙන් කියා දුන්නා.

“ඉතින් අපි ට බැරිද දැනට මුහුදේ තියෙන අපද්‍රව්‍ය පිරිසිදු කරන්න?” මම මීරා අක්කාගෙන් ඇහුවා.

මීරා අක්කා සතුටින් මං දිහා බලලා කියුවා “අපට එහෙම කරන්නත් පුළුවන් මම දන්නවා මේ ළඟම තියෙනවා කුණු ගොඩක් අපි එතනට ගිහින් ඒ කුණු ගොඩ පිරිසිදු කරමු නංගී.”

“ඔයා ඒ වැඩේට කැමතිද?” මම නංගීගෙන් ඇහුවා.

“මමත් ඒ වැඩේට කැමතියි.” නංගී දැඩි උනන්දුවකින් කියුවා.


අපි හැමෝම මීරා අක්කා පස්සෙන් ගියා

එන්න එන්නම පරිසරයේ අපවිත්‍ර බව වැඩි උනා. දුගඳත් වැඩි වුනා. හැම තැනම සතුන්ගේ මළකුණුත් තිබුණා. අන්තිමට අපි විශාල කුණු ගොඩක් තියෙන තැනකට ආවා. මට හිතුණා මිනිස්සු කරන මේ වැඩේ කොච්චර වැරදිද කියලා.

“ඔන්න අපි ආවා නංගී… දැන් අපි ගිහින් හොඳ දැලක් හොයා ගන්න ඕනි.” තැන් තැන්වල තිබුණු කුණු එක තැනකට ගොනු කරන ගමන් මීරා අක්කා කියුවා.

නංගී මමයි ඈතට ගිහින් හොඳ ලොකු දැලක් හොයා ගත්තා. දැලක් හොයා ගත්තත් අපි එතන අතරමං වෙලා. නංගී හයියෙන් ඇඬුවා.

“බයවෙන්න එපා නංගී. අපි කොහොම හරි මීරා අක්කා ඉන්න තැනට යමු.” මම නංගීව සනසන්න හැදුවා.





අපි හැම තැනම ගියා. ඒ උනාට කුණු ගොඩ පේන තෙක් මානයක නෑ. අපි හොඳට ම බය වුනා. අපි දන්න කෙනෙකුට හිටියේ මීරා අක්කා විතරයි. මීරා අක්කා අපිව හොයා ගෙන එන කල්, අපි එතන තිබුන ගලක් උඩ ඉඳගෙන හිටියා.

ටික වෙලාවක් ගියාට පස්සේ එතනින් ලොකු ඇඟක් තියෙන හරි හැඩි දැඩි මාළුවෙක් ගියා.

"නංගී අපි අර මාළුවාගෙන් අහමු." මම නංගීට කියුවා.

"අනේ අක්කේ එයා අපට ගහලා එලවලා දැම්මොත්..." නංගී කියුවා.

"ඒ වුණාට අපට දැන් කරන්න තියෙන්නේ ඒක විතරයි." මම නංගීට කියුවා.

නංගී ඒක ඇහුවට පස්සේ කැමති උනා. ඒත් මට තේරුණා විදිහට නම් එයාගේ එච්චර කැමැත්තක් තිබ්බේ නැහැ.

"හැබැයි අක්කේ ඔයා තමයි ඒ තඩි මාළුවාගෙන් කුණු ගොඩ තියෙන තැන අහන්න ඕන." නංගී කියුවා.

"බලමුකෝ..." මම කියුවා.

අපි දෙන්නා ඒ ලොකු මාළුවා ළඟට ළං වුනා.


අපි එයාට තට්ටු කළා. එයා හෙමින් අපි දිහා බැලුවා.

"අනේ යාළුවේ අපට කරදරයක් නම් කරන්න එපා. අපට අර කුණු ගොඩ ළඟට යන්න පාර කියනවද?" මම වෙවුලමින් ඒ අමුතු සතාගෙන් ඇහුවා.

එයා ටික වෙලාවක් කල්පනා කරා. "මම කියන්නම්. ඔහොම කෙලින්ම ඉස්සරහට යන්න. එතකොට කොරල් පරයක් හම්බවෙයි. එතනින් වමට හැරෙන්න. ඊට පස්සේ ටික දුරක් යනකොට මුහුදු පැළෑටි වගයක් හම්බවෙයි. එතැනින් දකුණට හැරෙන්න. තව ටික දුරක් යනකොට ඔයාලට කුණු කන්ද හම්බවෙයි."

ඒ අමුතු සතා අපිට එහෙම කියලා යන්න ගියා.

"අපි හිතපු තරම් ඒ සතා නපුරු නෑ නේද අක්කේ?" නංගී කියුවා.





“ඒක තමයි මම කියුවේ.” මම නංගීට කියුවා.

“ඒක නෙමේ අපි මේ සතා ගැන මීරා අක්කා හම්බ වුනාම අහගමු නේද?” නංගී මගෙන් ඇහුවා.

“ඒක නම් හොඳ අදහසක් අපි මීරා අක්කාගෙන් අහලා බලමු.” මම නංගීට කියුවා.

අපි ඒ මාළුවා කියපු පාර දිගේ ගියා. එයා කියුවා වාගේ ම අපට කුණු කන්ද ළඟට එන්න පුළුවන් උනා. මීරා අක්කා කුණු එක තැනකට ගොඩ ගහලා අපි එන කල් බලා ගෙන හිටියා.

“අපි අතරමං වුනානේ... ඊට පස්සේ එතන තිබුණු ගලක් ළඟ අපි වාඩි වෙලා හිටියා ඔයා අපිව හොයා ගන්න එන කල්. එතකොට එතැනින් ලොකු ඇඟක් තියෙන හැඩි දැඩි කළු පාට මාළුවෙක් ගියා. අපි එයාගෙන් අහලා තමයි මෙතනට ආවේ.”නංගී මීරා අක්කාට කියුවා.

“හා... එහෙම දෙයකුත් වුනා ද? මම නං හිටියේ ඔයාලා අතරමං වෙන්නේ නැති වෙයි කියලා.” මීරා අක්කා කියුවා.

“ඒ සතාගේ නම මොකක්ද?” මම මීරා අක්කාගෙන් ඇහුවා.


“එයාලාට කියන්නේ තල්මස්සු කියලා.” අක්කා කියුවා.


“එයාලා අපිව කනවාද?” නංගී ඇහුවා.

“සමහර විට කන්නත් පුළුවන් හැබැයි එයාලා හිතලා නෙවෙයි කරන්නේ. පොඩි පොඩි මාළු, ඉස්සෝ වගේ සත්තු තමයි එයාලා වැඩිපුර කන්නේ. ඉතිං ඒ අය කන්න කට අරින කොට අපි ඒ ළඟ හිටියොත් එයා දන්නෙම නැතිව අපිවත් ගිලෙන්න පුළුවන්.” මීරා අක්කා කියුවා.

“අපි දැන් කුණු අස් කරන්නේ නැද්ද අක්කේ?” මම මීරා අක්කාට දැල දෙන  ගමන් කියුවා.

“ඒකත් අමතක වුනා නේ... ඔය දෙන්නා ඔය දැල දිග ඇරලා බිම තියන්න... දැන් ඇවිල්ලා මේ කුණු ටික දැලට එකතු කරන්න.” මීරා අක්කා කියුවා.





අපි මීරා අක්කා කියුව විදිහටම කරා. ඊට පස්සේ අපි ඒ දැල ගැට ගැහුවා. අපි මුහුද උඩට දැලත් අරගෙන පීනාගෙන ආවා.

“අර ඈත කුණු එකතු කරන නැවක් තියෙනවා ඔයාලට පේනවා ඇති අන්න ඒකට තමයි මේක ගිහින් දාන්න ඕනි. හැබැයි කාටවත් නොපෙනෙන්න. අපි ඒක ළඟට ගිහින් මේ දැල නැවට විසි කරමු.” මීරා අක්කා පැහැදිලි කලා.

“හැමෝම ලෑස්තිද?” මීරා අක්කා ඇහුවා.

“අපි ලෑස්තියි.” නංගීයි මමයි කියුවා.

“එකායි... දෙකායි... තුනායි...”

එහෙම කියපු අපි ඒක ඈතට විසි කළා. අපි හිතපු විදිහටම දැල කුණු නැවට වැටුණා. අපට හරිම සතුටුයි. කවුරුවත් අපිව දැක්කේ නැහැ. අපි ආයෙත් මුහුද යටට ගියා.

“හරි අපි දැන් ආයෙත් ඩොල්රිගේ ගෙදර යන්න පිටත් වෙමු.” මීරා අක්කා කියුවා.

අපි ඩොල්රිගේ ගෙදර යන්න පිටත් වුණා. අපි ටික දුරක් යනකොට අපිට උල් දත් තියෙන ලොකු මාළුවෙක් හම්බ වුනා. නංගීයි මමයි එයා දැක්ක ගමන් බය වුනා. ඒ උනාට මීරා අක්කා නම් බය වුනේ නැහැ.

“අක්කේ ඒ කවුද? මට නම් එයා දැක්ක ගමන් ගොඩක් බය හිතුනා.” නංගී මීරා අක්කා ගෙන් ඇහුවා.


“එයාට කියන්නේ මෝරා කියලා.” මීරා අක්කා නංගීට කියලා දුන්නා.


ආයෙත් ඒ මෝරා මාළු රංචුවක් පස්සෙන් පන්නා ගෙන යනවා දැකලා මට  ප්‍රශ්නයක් ඇතිවුණා. “අක්කේ එයාලා අපිව කනවාද?”

“එයාලා අපිව කන්නේ නෑ. එයාලා මාළු විතරයි කන්නේ ඒක නිසා ඔයාලා බය වෙන්න ඕනේ නැහැ.” මීරා අක්කා කියුවා.

“අපි දැන් ඩොල්රිගේ ගෙදර යමුකෝ...” නංගී මීරා අක්කාගේ අතේ එල්ලෙමින් කියුවා

“යමු... යමු...” මීරා අක්කා නංගීගේ අත ගලවමින් සිනාසුණා.





අපි ටික දුරක් පිහිනුවා. ඈත ලොකු සුදු පාට ගලක් තියෙනවා වගේ මට පෙනුණා.

“අක්කේ අර ඈත පේන සුදු පාට ගල මොකක්ද?” මම ඒ ගල වෙත අත දික් කරමින් ඇහුවා.

මීරා අක්කා මම ඇඟිල්ල දික් කරපු දිහා හොඳින් බැලුවා. නංගීත් ඒ දිහා හොඳින් බැලුවා.

“කෝ අක්කේ මට එහෙම එකක් පේන්නේ නෑනේ...” නංගී පුදුමයෙන් මං දිහා බලා ගෙන කියුවා.

“අපි ළඟට ගිහින් බලමුකෝ... ඒකට කියන්නේ බෙල්ලා කියල.” මීරා අක්කා පැහැදිලි කලා.

අපි ඒක ළඟට යනකොටම ඒක ඇරුණා. ඒක ඇතුළේ සුදු පාට දිලිසෙන දෙයක් තිබුණා.

“අක්කේ, අර සුදු පාට දිලිසෙන දේ මොකක්ද?” මම මීරා අක්කාගෙන් ඇහුවා.

“ඒකට කියන්නේ මුතු ඇට කියලා.” මීරා අක්කා කියුවා.

“අපට ඒවා අල්ලන්න බැරිද අක්කේ?” නංගී ඇහුවා.

“අල්ලන්න නම් බෑ නංගී. ඒවා අපි අල්ලන්න ගියොත් එයාලාට ඒක අපහසුවක් වගේම මරණයට හේතුවක් වෙන්නත් පුළුවන්.” මීරා අක්කා නංගීට පැහැදිලි කර දුන්නා.

“ඒ කියන්නේ එයාලාට පණ තියෙනවා ද අක්කේ?” මම ඇහුවා.

“මොකද නැත්තේ අපි දැන් යමු. පරක්කු වෙනවනේ.” මීරා අක්කා කියුවා.


අපි ආයෙත් යන්න පිටත් වුනා. එක පාරටම අපි හිටපු තැනින් රෝස පාට දෙයක් ගියා. ඒක දිලිසෙන දෙයක්.

“මේ මොකක්ද මේ?” නංගී මීරා අක්කාගෙන් ඇහුවා.

“මෙයාට කියන්නේ ලොඩියා කියලා.” අක්කා අපට කියා දුන්නා.

“අනේ එයා හරිම ලස්සනයි.” එහෙම කියන ගමන් නංගී ලොඩියාව අල්ලන්න උත්සාහ කලා.

“නංගී නවතින්න. එයාලා ලස්සන උනාට හරිම විසයි. අල්ලන්න එපා ඔයා මැරෙයි.” මීරා අක්කා නංගීට අවවාද කලා.





"අක්කේ, දැන් ඩොල්ර්රිගේ ගෙදරට කිට්ටු ද?" මම මීරා අක්කාගෙන් ඇහුවා.

"ඔව් දැන් කිට්ටුයි. අපි යමු. අපි එන කල් ඩොල්ර්රි මග බලා ගෙන ඇති." මීරා අක්කා කියුවා.

"ඩොල්ර්රි කොහොමද අක්කේ දන්නේ අපි එයාගේ ගෙදර එනවා කියලා?... මෙහේ දුරකථන නෑ නේද?..." නංගී මීරා අක්කාගෙන් පිහිනා ගෙන යන ගමන් ඇහුවා.

"අපි ගාව දුරකථන නැති එක ඇත්ත නංගී... ඒ උනාට අපට පණිවිඩ හුවමාරු කර ගන්න පුළුවන්." මීරා අක්කා කියුවා.

"ඒ කොහොමද අක්කේ ඒ?..." මම කුතුහලයෙන් මීරා අක්කාගෙන් ඇහුවා.

"අපි පණිවිඩ යවන්නේ තලපතා අතේ. එයා තමයි මුහුදේ ඉන්න වේගවත් ම මාළුවා. අපි එයාට කියන්නේ තැපැල් මාළුවා කියලා. ආ.. මේ එන්නේ එයා.." මීරා අක්කා කියුවා.

"ආ මීරා... ඩොල්ර්රිගේ ගෙදර යනවා වගේ... මම පණිවිඩය දුන්නා. එයා ගොඩක් සතුටු උනා. පරිස්සමෙන් යන්න. ආ... ඒක නෙවෙයි... මේ කවුද මේ..?" තැපැල් මාළුවා මීරා අක්කාගෙන් ඇහුවා.

"මේ මගේ යාළුවෝ දෙන්නෙක්." මීරා අක්කා කියුවා.

"එහෙමද... මම එහෙනම් ගියා... බායි..." තැපැල් මාළුවා එහෙම කියලා යන්න ගියා.


ටික වේලාවකින් අපි ඩොල්ර්රිගේ ගෙදරට ආවා. ඩොල්ර්රි අපිව සාදරයෙන් පිළිගත්තා. ඩොල්ර්රි අපට රෑ කෑමත් පිළියෙල කරලා තිබුණා. ඒ තිබුණෙත් මුහුදු පැළෑටි. රෑ කෑම කන ගමන් මීරා අක්කා ඩොල්ර්රිට අපි කවුද කියලා හඳුන්වලා දුන්නා. කෑම කද්දී මම ඩොල්ර්රිගෙන් අහන්න හිටිය ප්‍රශ්නය මතක් වුනා.


"ඩොල්ර්රි අර මාළු ටැංකිවල ඉන්න මාළුවන්ට දාන කෑම හදලා තියෙන්නේ මොනවා දාලා ද?" මම ඩොල්ර්රිගෙන් ඇහුවා.

"ඒවට දාන්නේ නංගී මැස්සොයි දිය සෙවලයි මුහුදු පැළෑටියි." ඩොල්ර්රි මට කියලා දුන්නා.

"ඔයාගේ මුහුදු පැළෑටි සලාදය නම් හරිම රසයි. මටත් කියලා දෙන්නකෝ ඒවා හදන විදිය." මීරා අක්කා ඩොල්ර්රිට කියුවා.

"හරි හරි... මම තැපැල් මාළුවා අතේ ඒ වට්ටෝරුව එවන්නම්." ඩොල්ර්රි මීරා අක්කාට කියුවා.





අපි මුහුදු පැළෑටි සලාදය කාලා ඉවර වෙලා නිදා ගන්න ගියා. ඩොල්ෆි අපිට එයාගේ කාමරේයේම පැත්තක ඇඳක් දාලා දුන්නා. අපි ඇඳට ගිහින් හාන්සි වුනා. ඒ වෙලාවේ නංගීට ප්‍රශ්නයක් මතු වුනා.

"ඩොල්ෆි, ඇයි ඔයා නිදා ගනිද්දී ඇස් වහ ගන්නේ නැත්තේ?"

"නංගී, ඔයාලා ඇස් පියා ගන්නේ ඇස් පිරිසිදු වෙන්න. අපි නිතරම වතුරේ ඉන්න නිසා ඇස් වහ ගන්න ඕනේ නැහැ. දැන් නිදා ගන්න. සුබ රාත්‍රියක්!" එහෙම කියලා ඩොල්ෆි නිදා ගත්තා.

අපිත් නිදා ගත්තා. මට ඒ රෑ භයානක හීනයක් පෙනුණා. මම ඒ හීනයෙන් දැක්කේ අම්මයි අප්පච්චි සුනාමි රළට අහු වෙලා මැරිලා ඉන්නවා. මට ඒ වෙලාවේ දාඩිය දාලා තිබුණා. මට එකපාරටම ඇහැරුණා.

මීරා අක්කයි ඩොල්ෆියි ඇඳේ හිටියේ නැහැ. නංගී නම් ඇඳේ නිදා ගෙන හිටියා. මම නැගිටලා ගියා මීරා අක්කයි ඩොල්ෆියි ඉන්නේ කොහේද කියලා බලන්න.

මීරා අක්කා ආයෙත් ගෙදර යන්න බඩු ලෑස්ති කර කර හිටියා. ඩොල්ෆිත් මොනවද දෙයක් ලෑස්ති කර කර හිටියා. ඒ අතරේ නංගීත් ඇහැරිලා ආවා.


"හරි එහෙනම් දැන් ඔයාලා ගෙදර යන්න. මෙන්න ඔයාලාට පොඩි තෑග්ගක් ගෙදර ගිහින් ඇරලා බලන්න. පරිස්සමෙන් යන්න." ඩොල්ෆි දුකෙන් කියුවා.

"අපි ආයෙත් දවසක එන්නම්කෝ... තෑග්ගට බොහොම ස්තුතියි බායි ඩොල්ෆි!" මීරා අක්කා එහෙම කියලා අපිත් එක්ක ගෙදර යන්න පිටත් වුනා.

ඩොල්ෆි අපි යන දිහා දුකෙන් බලා ගෙන හිටියා. අපි ඈතට ගියා. මට එහෙම යද්දී අමුත්තක් දැනුණා. මට මගේ පිටිපස්සෙන් දෙයක් හඹා ගෙන එනවා වගේ දැනුණා. මම පිටිපස්ස බැලුවා. එතන දිලිසෙන අළු පාට දෙයක් තිබුණා. මම මීරා අක්කාට තට්ටු කරලා මෙහෙම ඇහුවා.

"අර දිලිසෙන දේ මොකක්ද?"

"එයාට කියන්නේ ආඳා කියලා." මීරා අක්කා මට කියා දුන්නා.





“මෙයා හරිම ලස්සනයි. මම මෙයාව අල්ලන්න ද?” නංගී මීරා අක්කාගෙන් ඇහුවා.

“අනේ... අනේ... නංගී... මම ඔයාට කී සැරයක් කියලා තියෙනවාද මුහුදේ තියෙන නාඳුනන ජාති අල්ලන්න එපා කියලා. එයාව ඇල්ලුවොත් ඔයා මළා තමා. එයාගේ ඇඟෙන් විදුලිය පිට වෙනවා.” අක්කා හිනා වෙවී නංගීට අවවාද කළා.

“අක්කේ අපි ඊයේ ආපු පාරේම ආපහු යන්නේ නැතිව වෙන පාරකින් යමු ද?” මම මීරා අක්කාගෙන් ඇහුවා.

“හරි. අපි එහෙනම් අද වෙන පාරකින් යමු.” මීරා අක්කා කියුවා.

අපි වෙන පාරකින් යන්න පිටත් වුනා. ටික දුරක් පිහිනා ගෙන යන කොට අපි තරුවක් වගේ ඇඟක් තියෙන සත්තු ගොඩක් ඉන්න තැනකට ආවා.

“මේ සත්තු ජාතිය මොකක්ද?” නංගී මීරා අක්කාගෙන් ඇහුවා.

“මෙයාලට කියන්නේ පසැඟිල්ලා කියලා. හරි ලස්සනයි නේද නංගී? ඒක නෙවෙයි නංගී... ඇයි ඔයා මෙයාලව අල්ලන්නද කියලා අහන්නේ නැත්තේ?” මීරා අක්කා නංගීගෙන් ඇහුවා.


“ඉතින් ඔයාමනේ අක්කේ කියන්නේ නාඳුනන ජාති අල්ලන්න එපා කියලා... ඒකයි මම ඇහුවේ නැත්තේ....” නංගී ඇඹරෙමින් කියුවා.


“මෙයාලාව නම් අල්ලන්න පුළුවන්. මෙයාලගෙන් කිසිම හානියක් වෙන්නේ නෑ. ඔයා අල්ලනවද?” මීරා අක්කා නංගීගෙන් අහුවා.

“ඕනේ නෑ අක්කේ... දැන් අපි ඉක්මන් කරලා ගෙදර යමු.” නංගී මීරා අක්කාට කිව්වා.

“දැන් මට ටිකක් බඩගිනියි වගේ. අපි මොනවා හරි කමුද?” මම මීරා අක්කාගෙන් ඇහුවා.

“හරි ඔයාට බඩගිනි නම් අපි කමු. කිසි ප්‍රශ්නයක් නෑ.” මීරා අක්කා කියුවා.





අපි මුහුදු පැළෑටි ටිකක් කඩා ගන්න මුහුදු පැළෑටි යායක් ළඟට ගියා. අපි මුහුදු පැළෑටි කඩමින් ඉන්න කොට, අපේ වටේට කළු පාට දෙයක් පැතිරී ගෙන ගියා. අපට මොකුත් ඒ වෙලාවේ පෙනුණේ නෑ. නංගී බය වෙලා මීරා අක්කාගේ අතේ එල්ලුණා.

ටික වෙලාවක් ගියාට පස්සේ කළු පාට දේ නැති වෙලා ගියා. එතන ඉස්සරහ දිග කකුල් තියෙන රෝස පාට වගේ සතෙක් හිටියා. එයා බය වෙලා වගේ වේගයෙන් පිහිනා ගෙන ගියා.

"ඒ මොකක්ද ඒ… අක්කේ…?" නංගී මීරා අක්කාගෙන් ඇහුවා.

"නංගී එයාට අපි කියන්නේ දැල්ලා කියලා." මීරා අක්කා නංගීට පැහැදිලි කර දුන්නා.

"එතකොට අක්කේ, එයාද ඒ කළු පාට දේ අපි ඉන්න තැනට දැම්මේ?" මම මීරා අක්කාගෙන් ඇහුවා.

"ඔව් නංගී… එයා තමයි ඒ වැඩේ කලේ. එයා හිතන්න ඇති අපි එයාගේ හතුරෙක් කියලා. එයාගේ ඇඟේ තියනවා කළු පාට තීන්ත වගේ ජාතියක්. එයාලා හතුරෙක් දැක්කම ඒ කළු පාට තීන්ත හතුරාගේ ඇඟට විදිනවා. එතකොට ඒ හතුරාට පෙනෙන්නේ නැතිව යනවා. ඒ අතරේ දැල්ලා එතනින් පැනලා යනවා. එතකොට දැල්ලාට හතුරාගෙන් බේරෙන්න පුළුවන්." අක්කා අපට පැහැදිලි කර දුන්නා.

"නියමයි නේ අක්කේ… අපි දැන් මේ ටික කාලා ඉමු නේද?" නංගී කියුවා.


අපි මුහුදු පැළෑටි කාලා බඩ පුරවා ගෙන ආයෙත් මීරා අක්කාගේ ගෙදර යන්න පිටත් වුනා.


අපි ටික දුරක් යන කොට නංගී "අක්කේ… අක්කේ…" කියලා කෑ ගහන්න පටන් ගත්තා.

මීරා අක්කයි මමයි, නංගී බලා ගෙන ඉන්න පැත්ත බැලුවා. එතන ඉබ්බෙක් වගේ සතෙක් හිටියා.

"මේ බලන්නකෝ අක්කේ… ලොකු ඉබ්බෙක්… හැබැයි ඉබ්බන්ට මේ වගේ කකුල් නෙවෙයිනේ තියෙන්නේ… වෙන සතෙක්වත්ද?" නංගී මීරා අක්කාට කියුවා.

"මෙයා ඉබ්බෙක් නෙවෙයි නංගී. මෙයාට කියන්නේ කැස්බෑවා කියලා. මෙයා ඉබ්බෙක් වගේමයි. හැබැයි ටිකක් වෙනස්. ඉබ්බෝ ඉන්නේ මිරිදියේ. හැබැයි මෙයා ඉන්නේ මුහුදේ. දෙන්නගේ කකුල් ගත්තත් වෙනස්. හැබැයි කටුව නම් එක වගේ.





කැස්බෑවෝ බිත්තර දාන්නේ හරි අමුතු විදිහකට. එයාලා බිත්තර දාන්නේ මුහුදු වෙරළේ වැල්ලේ වලක් හාරලා. උණුසුම් වෙරළක බිත්තර දැම්මොත් ඒවගෙන් හැදෙන්නේ ගැහැණු පැටව්. සීතල වෙරළක බිත්තර දැම්මොත් ඒවගෙන් හැදෙන්නේ පිරිමි පැටව්." මීරා අක්කා අපට පැහැදිලි කර දුන්නා.

"එයාලා හරි අමුතු විදියකට බිත්තර දාන්නේ." මම පුදුම වුනා.

"දැන් රෑත් වෙලා... අපි ගෙදර යමු...." මීරා අක්කා කියුවා.

අපි ආයෙත් යන්න පිටත් වුනා. අපි පිහිනන ගමන්, මම මීරා අක්කාට මෙහෙම කියුවා.

"අක්කේ... අපිට හෙට ගෙදර යන්න ඕනේ... මට අම්මයි අප්පච්චියි නැතිව හරි පාළුයි..."

"ආ... ඒකත් එහෙමද? එහෙනම් හෙට අපි ගොඩට ගිහිල්ලා ඔයාලාගේ අම්මලාව හොයා ගන්න බලමු." මීරා අක්කා කියුවා.

ඔහොම ටික දුරක් යන කොට මට දිලිසෙන දෙයක් පෙනුණා.

"ඒ කවුද?" මම මීරා අක්කාගෙන් ඇහුවා.

"එයාට කියන්නේ බූවල්ලා කියලා. එයාලා රෑට එළිය ලබාගන්නේ ඔය වගේ දිලිසිලා. එයාලාගේ ජාතියේ සමහර අයට පාට මාරු කරන්නත් පුළුවන්. ඒ වාගේ ම එයාලාට පොඩි හිලකින් උනත් අනිත් පැත්තට යන්න පුළුවන්. ඔය වගේ නැවක් විතර ලොකු බූවල්ලෝත් ඉන්නවා." අක්කා අපට කියලා දුන්නා.


අන්තිමේ දී අපි මීරා අක්කාගේ ගෙදරට ආවා. මීරා අක්කා ඩොල්ෆි දුන්න තෑග්ග මේසයේ උඩ තියලා මෙහෙම කියුවා.


"අපි මේක දිග ඇරලා බලමු නේද?"

අපි තෑග්ග දිග ඇරලා බැලුවා. ඒක ඇතුළේ තිබුණේ මුහුදු පැළෑටි බීම. මීරා අක්කා ගොඩක් සතුටු වුනා.

එතකොට ම දොරට තට්ටු කරන සද්දයක් ඇහුණා.

මීරා අක්කා ගිහින් දොර ඇරියා. එතන හිටියේ තැපැල් මාළුවා. එයාගේ අතේ තිබුණේ මුහුදු පැළෑටි සලාද වට්ටෝරුව. ඒත් එක්කම මුහුදු පැළෑටි බීම එකේ වට්ටෝරුවත් තිබුණා.





මීරා අක්කා ඒ වට්ටෝරුවේ තිබුණ විදිහට මුහුදු පැළෑටි සලාදයක් හැදුවා. අපි සලාදය කාලා බීම එක බිව්වා. ඊට පස්සේ අපි නිදා ගත්තා.

මම උදෙන් ම නැගිට්ටා. නංගීයි මීරා අක්කායි ඇඳේ හිටියේ නැහැ. මම නැගිටලා කුස්සියට ගියා. නංගීයි මීරා අක්කයි කෑම කමින් හිටියා. මමත් ගිහින් කන්න පටන් ගත්තා. හදිස්සියට මම කෑම ටික කටට දෙකට කෑවා.

අපි කාලා ඉවර වෙලා යන්න පිටත් වුනා. අපි මුහුද උඩට පිහිනා ගෙන ගියා.

වෙරළ කිට්ටුව තිබුණු ගල් පරයක හැංගිලා අපි අම්මයි අප්පච්චියි ඉන්නවද කියලා හොයලා බැලුවා. ගොඩක් මිනිස්සු නැති වුන අයව හොයමින් ඇවිදින බව අපට පෙනුණා. සුනාමිය නිසා ලොකු විනාශයක් වෙලා තිබුණා.

අම්මයි අප්පච්චියි කැඩුණ ගෙයක් ළඟ අපිව හොය හොයා හිටියා. මීරා අක්කා අපි දෙන්නව ආයෙත් මිනිස්සු කරලා අම්මටයි අප්පච්චිටයි බාර දුන්නා.


“ඔයාට බොහොම පිං අපේ ළමයි දෙන්නා බේරලා දුන්නාට...!” අම්මයි අප්පච්චියි මීරා අක්කාට ස්තුති කලා.

“හොඳ ළමයින්ට අපි උදව් කරනවා.... ඕන වෙලාවක ආයෙත් මාව බලන්න එන්න.... මම එහෙනම් යන්නම්.” මීරා අක්කා යන ගමන් කියුවා.

“බොහොම ස්තුතියි අක්කේ...! ඩොල්ෆිවත් මතක් කළා කියන්න...!” නංගීයි මමයි කියුවා.

මීරා අක්කා නිකම්ම ගියේ නෑ. එයා අපට වතුරට වැටුණා ම දිය කිඳුරියෝ වෙන්න පුළුවන් විදිහේ බලයක් දුන්නා. අම්මටයි අප්පච්චිටයි දෙන්නටත් ඒ බලයම දුන්නා. අපි දෙන්නා, අම්මටයි අප්පච්චිටයි සිද්ධ උන දේවල් සේරම කියුවා.

අපි දෙන්නා ආයේ වතුරට බය වුනේ නම් නැහැ.





# පසු වදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොට ගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-337-7

9 786242 083377